# මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2013.

3 වසර | ත්‍රිපිටක ධර්මය | කාලය පැ 3 යි.

01 ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු ලියන්න.

1. කෙටි පිළිතුරු ලියන්න.
   i. බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට පැන වූ විනය ශික්ෂා පද කීයද ?
   ii. බුදුරජාණන් වහන්සේගේ අන්තිම ශ්‍රාවකයා කව්ද ?
   iii. අනුන්ට හිංසා කරන්නන්ට පරලොව සුගතියක් සිදු නොවන බව ප්‍රකාශ කළේ කාහට ද ?
   iv. ත්‍රිපිටකය නම් කරන්න.
   v. සත්‍යවාදීව කටයුතු කිරීමේ අගය වටහා දෙන ජාතක කථාව කුමක් ද?
   vi. මිහිඳු මාහිමියන්ගේ උපාධ්‍යායයන් වහන්සේ කවරහු ද ?
   vii. භාවනාව ප්‍රධාන කොටස් දෙකකි. ඒ මොනවා ද ?
   viii. සතර පරමාර්ථ නම් කරන්න.
   ix. අකුසල සිත් කීය ද ? ඒවා බෙදා දක්වන්න.
   x. චතුරාර්‍ය සත්‍යය නම් කරන්න. (ලකුණු 3x10 = 30)

2. බුදුරජාණන් වහන්සේගේ අවසාන සමය පිළිබඳ ව ප්‍රමාණවත් විස්තරයක් සපයන්න (ලකුණු 14)

3. ක්ෂාන්තිවාදි ජාතකය ලියා ඉන් ලබා දෙන ආදර්ශය පැහැදිලි කරන්න. (ලකුණු 14)

4. i. අචිරං වතයං කායො..... ගාථාව සහ එහි තේරුම ලියන්න. (ලකුණු 07)
   ii. ඉහත ගාථාවට අයත් නිදාන කථාව ගෙන හැර දක්වන්න. (ලකුණු 07)

5. දුක්ඛ ආර්ය සත්‍ය පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් කරන්න. (ලකුණු 14)

6. උජ්ජග්ඝික වග්ගයේ සේඛියා 5ක් හා ඒවායේ තේරුම ලියන්න. (ලකුණු 14)

7. චිත්ත පරමාර්ථයේ මූලික කොටස් හතර නම් කර අහේතුක සිත් දහඅට ප්‍රභේද ගත කරන්න. (ලකුණු 14)

8. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන විස්තරයක් ලියන්න.
   i. මිහිඳු මහරහතන් වහන්සේ
   ii. විහාර මහා දේවිය
   iii. සංඝමිත්තා තෙරණියෝ (ලකුණු 14)

9. සොළොස් මහ ජනපද නම් කර ඉන් 3 ක් විස්තර කරන්න. (ලකුණු 14)